# ප්‍රවාහනය සහ සැපයුම් සේවා

## ප්‍රවාහනය

**"එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට විවිධ මාධ්‍යන් භවිතා කරමින් පුද්ගලයන් හෝ ද්‍රව්‍ය ගෙන යාමේ ක්‍රියවලිය" ප්‍රවාහනය ලෙස හඳුන්වයි.**

**ප්‍රවාහනය යනු පද්ධතියකි. එය පහත මූලිකාංග වලින් සකස් වී ඇත.**

1. මාර්ගය
2. මාධ්‍ය
3. බලය
4. පර්යන්තය

ප්‍රවාහනයේ වැදගත්කම

1. ව්‍යාපාරිකයාට
   - අමුද්‍රව්‍ය කලට වෙලාවට ලබා ගැනීමට
   - නිමිද්‍රව්‍ය කලට වෙලාවට වෙළඳපලට ලබා දීමට
   - සේවකයින් ආයතන වෙත ගෙන්වා ගැනීමට
   - ව්‍යාපාරික සම්බන්ධතා පවත්වාගෙන යාමට
   - වෙළඳපල ව්‍යාප්තියට
   - පාරිභෝගිකයාට අඛණ්ඩව භාණ්ඩ හා සේවා ලබා දීමට

2. පාරිභෝගිකයාට
   - නියමිත වෙලාවට වෙළඳපලට ළඟා වීම සඳහා
   - අවශ්‍ය කරන භාණ්ඩ කලට වේලාවට ලබා ගෙන නිවෙස් කරා රැගෙන යාමට හැකි වීම
   - ඕනෑම රටක භාණ්ඩ හා සේවා තම රටේදී පරිභෝජනයට අවස්ථාව ලැබීම
   - ඕනෑම ස්ථානයකින් තමාට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට අවස්ථාව ලැබීම

3. ආර්ථිකයට
   - සේවා නියුක්තිය වර්ධනය වීම
   - ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීම
   - විදේශ වෙළඳාම වර්ධනය වීම
   - ජාතික නිෂ්පාදිතය වර්ධනය වීම
   - ආර්ථික වර්ධනයට සහය වීම

4. සමාජයට
   - මානව සම්බන්ධතා ඇති කර ගැනීමට (ගමන් බිමන්)
   - පුද්ගල සංවර්ධනය ඇති කර ගැනීමට (අධ්‍යාපනික, විනෝදාත්මක, සංස්කෘතිකමය වශයෙන්)
   - දේශීය හා අන්තර්ජාතික සම්බන්ධතා පවත්වාගෙන යාමට (වෙළඳ කටයුතු, ආර්ථික හා සමාජයීය වශයෙන් සම්බන්ධතා පවත්වා ගැනීම)
   - විවිධ ගවේෂණ කටයුතු වලදී උපකාරී වීම
   - යුධ කටයුතු සඳහා යොදා ගැනීම

විවිධ ප්‍රවාහන ක්‍රම

මහාමාර්ග ප්‍රවාහනය

මහාමාර්ග ප්‍රවාහනයේ වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. දිවයින පුරා ව්‍යාප්තව පැවතීම<br>2. අවශ්‍ය ඕනෑම විටෙක මහා මාර්ග භාවිත කල හැකි වීම<br>3. අවශ්‍යතා වලට ගැලපෙන මාධ්‍යක් තෝරා ගත හැකි වීම<br>4. ද්විත්ව ප්‍රවාහන පිරිවැයක් දැරීමට සිදු නොවීම / ගමනාන්තය දක්වාම එකම ප්‍රවාහන මාධ්‍යක් යොදා ගත හැකි වීම<br>5. කෙටි දුර ගමන් සඳහා වේගවත් ක්‍රමයක් වීම | 1. විශාල ධාරිතාවක් එකවර ප්‍රවාහන අපහසු වීම<br>2. ප්‍රමාදය හා අනතුරු බහුල වීම<br>3. කාලගුණික බාධා ඇති වීම<br>4. මහාමාර්ග නිසි ලෙස නඩත්තු නොකිරීම<br>5. මාර්ග තදබදය |

මහාමාර්ග වල තදබධය අඩු කිරීමට යෝජනා / ගෙන ඇති පියවර

- නව මහා මාර්ග තැනීම සහ නවීකරණය
- ගුවන් පාලම් සහ උමං මාර්ග ඉදි කිරීම
- අබලන් වූ වාහන පාවිච්චියෙන් ඉවත් කිරීමට කටයුතු යෙදීම
- අනවශ්‍ය ලෙස වාහන ආනයනය කිරීම සීමා කිරීම
- මාර්ග සඥා පද්ධති නිසි පරිදි නඩත්තු කිරීම
- රථවාහන නීතිරීති අකුරට ක්‍රියාත්මක කිරීම

දුම්රිය ප්‍රවාහනය

දුම්රිය ප්‍රවාහනයේ වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. විශාල ධාරිතාවයකින් ප්‍රවාහනය සිදු කල හැකි වීම<br>2. මහාමාර්ග ප්‍රවාහනයට වඩා ආරක්ෂාකාරී වීම<br>3. අවශ්‍යතාව අනුව දුම්රිය මැදිරි තෝරා ගත හැකි වීම<br>4. සෙසු ප්‍රවාහන මාධ්‍යන්ට සාපේක්ෂව පිරිවැය අඩු වීම | 1. දිවයින පුරා ව්‍යාප්තව නොතිබීම<br>2. අවශ්‍ය ඕනෑම විටක භාවිතා කල නොහැකි වීම<br>3. ද්විත්ව ප්‍රවාහන පිරිවැයක් දැරීමට සිදු වීම<br>4. කෙටි දුර ගමන් සඳහා යෝග්‍ය නොවීම<br>5. ප්‍රමාදයන් බහුල වීම |

දුම්රිය ප්‍රවාහනය සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

- දුම්රිය මාර්ග පුළුල් කිරීම
- දුම්රිය බලවේග කට්ටල ආනයනය කිරීම
- දුම්රිය නඩත්තු සේවා දියුණු කිරීම
- පටු දුම්රිය මාර්ග පුළුල් කිරීම
- ඉහළ කළමනාකරණයේ වෙනස්කම් ඇති කිරීම
- විදේශ විශේෂඥයන්ගෙන් උපදෙස් ලබා ගැනීම

නාවික ප්‍රවාහනය

නාවික ප්‍රවහනයේ වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. අන්තර්ජාතික වෙළඳාමට සහය වීම<br>2. විශාල ධාරිතාවයකින් ප්‍රවාහන කටයුතු සිදු කල හැකි වීම<br>3. අවශ්‍යතාව අනුව යාත්‍රා තෝරා ගත හැකි වීම<br>4. සාපේක්ෂ වශයෙන් පිරිවැය අඩු වීම | 1. නැව් සේවාව සුලභ නොවීම<br>2. වැඩි කාලයක් ගත වීම<br>3. ඉක්මනින් නශ්‍ය වන භාණ්ඩ සඳහා යෝග්‍ය නොවීම<br>4. කාලගුණික තත්වයන්ගෙන් බාධා පැමිණීම<br>5. ලෝකයේ ඕනෑම රටකට යෝග්‍ය නොවීම |

ගුවන් ප්‍රවාහනය

ගුවන් ප්‍රවාහනයේ වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| 1. වේගවත් බව අතින් ඉහළ වීම<br>2. ඉක්මනින් නශ්‍ය වන භාණ්ඩ සඳහා යෝග්‍ය වීම<br>3. මාර්ග නඩත්තු පිරිවැයක් නොමැති වීම<br>4. නිශ්චිත කාල සටහනකට අනුව ක්‍රියාත්මක වීම<br>5. ආචාරශීලී බව හා සුවපහසුව | 1. විශාල සහ අධික බරින් යුත් භාණ්ඩ ප්‍රවාහනයට යෝග්‍ය නොවීම<br>2. ප්‍රවාහන පිරිවැය අධික වීම<br>3. අනතුරක් සිදු වුවහොත් හානිය බරපතල වීම<br>4. අවශ්‍ය වෙලාවට සපයා ගත නොහැකි වීමට<br>5. රට පුරාම ව්‍යාප්තව නොතිබීම |

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග / යෝජනා

1. නව මාර්ග ඉදි කිරීම හා පවතින මාර්ග පුළුල් කිරීම
2. නැවතුම්පොළවල් සංවර්ධනය කිරීම
3. පරිසර හිතකාමී බලශක්ති භාවිතයට යොමු වීම
4. ප්‍රවාහනයට අදාළ නීතිරීති පැනවීම හා ක්‍රියාත්මක කිරීම
5. අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය දියුණු කිරීම
6. ප්‍රවාහන මාධ්‍යන් අතර අන්තර් සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීම
7. නගර වල රථවාහන සැලැස්මවල් ක්‍රියාවට නැංවීම
8. පෞද්ගලික හා රාජ්‍ය අංශය අතර සහයෝගිතාව වර්ධනය කිරීම

"ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමය සෘජු දායකත්වයක් දක්වයි"

1. මහා පරිමාණ නිෂ්පාදනයට උපකාරී වීම නිසා නිෂ්පාදනය ඉහළ යාම
2. වෙළඳපල පුළුල් වීම මඟින් පරිභෝජනය පහසු වීම
3. කලට වෙලාවට භාණ්ඩ ලබා ගැනීමට හැකි වීම
4. පිරිවැය අඩු වීමට හේතු වීම
5. අඩු පිරිවැයකින් ගුණාත්මක භාණ්ඩ ලබා ගත හැකි වීම
6. සේවකයින් කලට වෙලාවට නිෂ්පාදන ආයතන වෙත ළඟා වීම
7. නිෂ්පාදන ආයතන වලට අවශ්‍ය අමුද්‍රව්‍ය කලට වෙලාවට ලබා ගැනීමට හැකි වීම

<u>ප්‍රවාහන මාධ්‍යක් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු</u>

1. භාණ්ඩයේ ස්වභාවය
   භාණ්ඩයේ ස්වරූපය, කල්පැවැත්ම, බර, වටිනාකම ආදිය පිළිබඳ සැලකිය යුතුය.
2. පිරිවැය
   භාණ්ඩයේ මිල රඳා පවතින ප්‍රධාන සාධකයක් වන්නේ ප්‍රවාහන පිරිවයයි.
3. වේගය
   සමහර අමුද්‍රව්‍ය හා භාණ්ඩ නශ්‍ය වන බැවින් ඉක්මනින් ප්‍රවාහනය කිරීම අවශ්‍ය වේ. එසේම වේගවත් ප්‍රවහනයක් තුළින් කාලය ඉතිරිකර ගත හැකිය.
4. ධාරිතාව
   ප්‍රවාහන මාධ්‍ය මඟින් වරකට ප්‍රවාහනය කල හැකි ප්‍රමාණයයි.
5. සුරක්ෂිත බව
   ප්‍රවාහනය කරන භාණ්ඩය හෝ මගින් ආරක්ෂාකාරීව ගමනාන්තය දක්වා ගෙන යාමට හැකි විය යුතුය.
6. දුර ප්‍රමාණය
   දුර අනුව විවිධ මාධ්‍යන් සඳහා වැය වන පිරිවැය ද වෙනස් වේ.

<u>හොඳ ප්‍රවාහන ක්‍රමයක ගුණාංග</u>

- පිරිවැය අවම වීම
- වේගය
- ධාරිතාව
- නෛතික පැවැත්ම
- සුරක්ෂිත බව
- සුලභතාව
- ප්‍රමිති හා අන්තර්ජාතික සම්මත

<u>ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය වන ප්‍රවණතා</u>

- උමං මාර්ග ප්‍රවාහනය
- ගුවන් පාලම් ඉදි කිරීම
- අධිවේගී මාර්ග
- විදුලි මෝටර් රථ සහ දෙමුහුන් මෝටර් රථ
- පරිසර හිතකාමී බලශක්ති භාවිතය
- අන්තර් පළාත් සහ පළාත් අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරිම

<u>ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනාගතය</u>

- හයිපර්ලූප් සංකල්පය
- **Walk Car / Air Wheel**


## <u>ප්‍රවාහන හා සැපයුම් සේවා</u>

**"භාණ්ඩ හා සේවා හා අදාළ තොරතුරු ආරම්භක අවස්ථාවේ සිට අවසන් පාරිභෝගිකයා දක්වා කාර්යක්ෂමව හා සඵලදායිව ලබා දීමේ ක්‍රියාවලිය සැලසුම් කිරීම, සංවිධානය, මෙහෙය වීම හා පාලනය සම්බන්ධ කටයුතු" ප්‍රවාහනය හා සැපයුම් සේවා ලෙස හඳුන්වයි.**

ආයතනයක මෙහෙයුම් කටයුතු සුමට ව ගලා යාම සඳහා සැලසුම් කරන ලද ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක් අවශ්‍ය වේ.

ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති, මූලික ක්‍රියාවලි දෙකක් ඔස්සේ ක්‍රියාත්මක වේ. එනම්,

1. අමුද්‍රව්‍ය හෝ නිමිද්‍රව්‍ය සැපයුම්කරුවන්ගෙන් මිල දී ගැනීමේ සිට නිෂ්පාදන අවස්ථාව දක්වා ක්‍රියාවලිය **(Inbound Logistics)**
2. නිෂ්පාදනයෙන් පසු නිෂ්පාදිත හෝ අදාළ තොරතුරු අවසාන පාරිභෝගිකයා වෙත සැපයීම දක්වා වූ ක්‍රියාවලිය **(Outbound Logistics)**




<u>සැපයුම් හා සේවා පද්ධති</u>

ආයතන වල ස්වරූපය, නිෂ්පාදිත වල ස්වරූපය අනුව විවිධ ආකාරයේ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති පැවතිය හැකිය.

1. සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති **(Balanced Logistics System)**
   නිෂ්පාදන ආයතනය තෙක් ප්‍රවාහනය මෙන්ම නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා දක්වා ප්‍රවාහනය එකසේ සමානව පවත්වාගෙන යන පද්ධති. උදා : පරිභෝගික භාණ්ඩ

2. නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහනය සංකීර්ණ වූ පද්ධති **(Heavy Inbound Logistics Systems)**
   නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහනය සංකීර්ණ, එනම් නිෂ්පාදනයෙන් පසු පාරිභෝගිකයාට ලබා දීම සරල වන පද්ධති. උදා : ගුවන් යානා, නැව්

3. නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත් කිරීම සංකීර්ණ වූ පද්ධති **(Heavy outbound Logistics Systems**
   නිෂ්පාදිත පාරිභෝගිකයාට ලබා දීමට සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කරන පද්ධති
   උදා : පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය

4. නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහනය සහිත පද්ධති **(Reverse Logistics Systems)**
   පාරිභෝගිකයා වෙත භාණ්ඩ ලබා දීමෙන් පසුව ද නිෂ්පාදිත සැපයුම් ආයතන සමඟ සම්බන්ධ ප්‍රවාහයක් සහිත පද්ධති උදා : ගෑස්

<u>ප්‍රවාහන හා සැපයුම් සේවා වල අවශ්‍යතාව</u>

1. නිවැරදි නිෂ්පාදිතය, නිවැරදි ප්‍රමාණයෙන්, නිවැරදි වෙලාවට, නිවැරදි ස්ථානයේ දී, නිවැරදි මිලට, හොඳ තත්වයෙන් නිවැරදි පාරිභෝගිකයාට සැපයීමට

2. තොග පාලනය, නිෂ්පාදන සැලසුම්කරණය, ද්‍රව්‍ය මිල දී ගැනීම, ප්‍රවාහනය, ගබඩාකරණය ආදී කාර්යයන් විධිමත්ව සිදු කිරීමට

3. නිෂ්පාදනයට අවශ්‍ය නියමිත ද්‍රව්‍ය, නියමිත ප්‍රමාණයෙන්, නියමිත ගුණත්වයෙන්, නියමිත වෙලාවට ලැබෙන්නේද යන්න සහතික කර ගැනීමට

4. වෙළඳපල පර්යේෂණ, අවශ්‍යතා සැලසුම් කිරීම, නිපදවන්නේද මිලදී ගන්නේද යන්න තීරණය කිරීම ආදිය තුළින් පිරිවැය අවම කර ගැනීමට

5. සැපයුම් දාමය අඛණ්ඩව පවත්වාගෙන යාමට

<u>ප්‍රවාහන හා සැපයුම් සේවා වල ප්‍රයෝජන / වාසි</u>

1. නිෂ්පාදිත අඛණ්ඩව වෙළඳපලට සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම.

2. සියළුම කාර්යයන් සැලසුම් සහගතව සිදු කිරීම නිසා නාස්තිය හා අපතය අවම වීම තුළින් පිරිවැය අඩු කර ගත හැකි වීම.

3. තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීම.

4. නිෂ්පාදිත වල ගුණත්වය ආරක්ෂා කර ගත හැකි වීම

5. අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදු වීමෙන් ඒ ආශ්‍රිත ගැටළු අවම වීම.

6. කර්මාන්තය තුළ ප්‍රමුඛයා බවට පත් විය හැකි වීම.

7. ව්‍යාපාර ආයතනය පුළුල් වීමේදී ඇති විය හැකි සංකීර්ණතා අවම වීම.

## ගබඩාකරණය

**"ව්‍යාපාර ආයතනයකට තොගයක් මිලදී ගත් අවස්ථාවේ හෝ නිෂ්පාදනයෙන් පසුව හෝ ඒවා අලෙවි කිරීම දක්වා හෝ නැවත භාවිතයට ගන්නා තෙක් හෝ බෙදාහරින තෙක් හෝ රැස් කර තබා ගැනීමේ ක්‍රියාවලිය" ගබඩාකරණය ලෙස හඳුන්වයි.**

### ගබඩාකරණ ක්‍රියාවලිය

1. තොග ලැබීම
2. ලැබුනු තොග හඳුනා ගැනීම
3. තොග පරීක්ෂා කිරීම
4. නිවැරදි බව තහවුරු කර ගැනීම
5. ගුණත්වය ආරක්ෂා කිරීම
6. ඉවත් කිරීම
7. නිකුත් කිරීම සඳහා නැවත ලබා ගැනීම

### ගබඩාව

**"තොග රැස් කර තබා ගැනීමට හෝ කල් තබා ගැනීමට යොදා ගන්නා ස්ථානය" ගබඩාව ලෙස හඳුන්වයි.**

### ගබඩාවක් ස්ථානගත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

1. ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම සහ ඉඩකඩ
   ගබඩාව සඳහා භාවිත කරන ගොඩනැගිල්ලේ ස්වභාවය පිළිබඳ අවධානය යොමු කල යුතුය. එහිදී ගබඩාවේ ඉඩකඩ, වහලයේ ස්වභාවය, මෙහෙයුම් කාර්යයේ ස්වභාවය, භාවිත කරන උපකරණ, දොරවල් වල උස, ප්‍රමාණ හා පිහිටීම ආදිය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

2. තොග භාවිතයේ ශීඝ්‍රතාව සහ ගබඩාව තුළ කලාප වෙන්කිරීමේ අවශ්‍යතාව
   කෙතරම් ශීඝ්‍රතාවකින් තොග ලබා ගැනීම, පවත්වා ගැනීම, නිකුත් කිරීම සිදු වන්නේද යන්න සැලකිල්ලට ගෙන ගබඩාවක් ස්ථාන ගත කල යුතුය.

3. ප්‍රධාන සම්බන්ධතා වලට ආසන්නතාව
   ගබඩා කර ඇති භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ම ප්‍රවාහන ක්‍රමය කුමක් ද යන්න මත ගබඩාවක් ස්ථාන ගත කල යුතුය. භාණ්ඩයක පිරිවැයෙන් සැලකිය යුතු අගයක් ප්‍රවාහන වියදම් මත රඳා පවතින නිසා මේ පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්විය යුතුය.

4. ද්‍රව්‍ය මෙහෙයුම් කිරීමේ හැකියාව
   ද්‍රව්‍ය ඇසිරීමේ පහසුකම් හා ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ උපකරණ හැසිරවීමේ පහසුකම් සහිත වීම ගබඩාවක් ස්ථාන ගත කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණකි.

5. ගබඩා කරන ද්‍රව්‍යයේ ස්වභාවය
   ගබඩා කරන ද්‍රව්‍යයේ ස්වභාවය අනුව ගබඩාව ස්ථාන ගත කල යුතු ආකාරය එකිනෙකට වෙනස් වේ.

6. පිරිවැය
   ගබඩා පිරිවැය අවම වන සේ ගබඩාවක් ස්ථාන ගත කල යුතුය. මෙහිදී ගබඩා කුලිය, ඇප තැන්පතු, රක්ෂණ ගාස්තු, වාහන නවතා තැබීමේ වියදම් ආදිය ගැන සැලකිලිමත් විය යුතුය.

ගබඩාවක භාණ්ඩ ඇසිරීම සිදු කල හැකි ආකාර

1. තට්ටු ඇසුරුම් ක්‍රමය
   - පහසු හා ලාභදායි භාණ්ඩ ඇසිරීමේ ක්‍රමයකි.
   - එහා මෙහා කල හැකි තට්ටු ගණනාවක් රාමුවක් තුළ එකමත එක තැබීමෙන් භාණ්ඩ අසුරනු ලැබේ.

2. භාණ්ඩ ගොඩවල් වශයෙන් ඇසිරීම
   - එකම වර්ගයේ භාණ්ඩ ගබඩාවේ බිම එක් ස්ථානයක එක මත එක ඇසිරීම මෙහිදී සිදු වේ.

3. එහා මෙහා කල හැකි තට්ටු සහිත රාමු
   - තට්ටු ගණනාවකින් සැදුම් ලත් පීලි හෝ එහා මෙහා කිරීමේ පටි වලින් සමන්විත වේ.
   - භාණ්ඩ ගබඩා කිරීමත් නැවත ලබා ගැනීමත් එකම පැත්තකින් සිදු කෙරෙන හෝ ගබඩා කිරීම එක් පසකිනුත්, ලබා ගැනීම අනෙක් පසිනුත් සිදු කිරීමට හැකි පරිදි සවි කල හැකිය.
   - පිරිවැය ඉතා ඉහළ ශීතාගාර සහිත ගබඩාවල භාණ්ඩ ඇසිරීමට යෝග්‍ය වේ.

4. පසුපසට තල්ලු කරන රාක්ක
   - තට්ටු සහිත රාක්ක වලට කුඩා කුඩ සවි කර ඇති ක්‍රමයකි. කුඩ එකක් මත එකක් වන පරිදි තට්ටු කිහිපයක් ඇසිරිය හැකිය.

5. තට්ටු දෙකක් අතර ඇති අමතර තට්ටුව
   - ගබඩාවක තට්ටු දෙකක් අතර අමතර තට්ටුවක් නිර්මාණය කර ද්‍රව්‍ය ගබඩා කිරීම මෙහිදී සිදු වේ.
   - මෙමගින් ගබඩාවේ ඉඩකඩ ප්‍රශස්ත අයුරින් භාවිත කල හැකිය.

6. ස්වයංක්‍රිය ඇසුරුම් ක්‍රමය
   - පරිගණක තාක්ෂනය මඟින් පාලනය කරනු ලබන යාන්ත්‍රික අතක ආධාරයෙන් ගබඩාවේ ද්‍රව්‍ය  ඇසිරීම මෙන්ම ලබා ගැනීම මෙහිදී සිදු වේ.
   - ලේඛනාගාරයක අදාළ අයිතම ඇසිරීම හා ලබා ගැනීම සඳහා මෙම ක්‍රමය යෝග්‍ය වේ.

ගබඩාවක් තුළ භාණ්ඩ එහා මෙහා කිරීමට භාවිතා කරන විවිධ උපකරණ

- ෆෝක් ලිෆ්ට්
- ෆොක් ලිෆ්ට් සහිත ට්‍රක්
- පැලට් ජැක්ස්
- භාණ්ඩ එහා මෙහා කිරීමේ පටි

ගබඩාවක් තුළ විවිධ උපකරණ භාවිතයේ ප්‍රයෝජන

1. සංවිධානාත්මකව ගබඩාව පවත්වාගෙන යාමට හැකි වීම
2. ආරක්ෂා සහිත බව ඇති කිරීම
3. කාලය හා ශ්‍රමය ඉතිරි වීම
4. ගබඩාවේ ඉඩකඩ ප්‍රශස්ත අයුරින් යොදා ගත හැකි වීම
5. මිනිස් ශ්‍රමයෙන් ඉටු කල නොහැකි දේ ඉටු කර ගත හැකි වීම

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

**www.ALNoteBook.com**

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”